**පදවිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 12 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ). ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2018 සංවර්ධන වැඩසටහන් යටතේ ඉදිකර තිබුණු රු.7,322,412 වටිනා ජල පිරිපහදු මධ්‍යස්ථාන 03 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරි ගිණුම් සකස් කිරීමේදී ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොතිබුණු අතර 2017 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවූ රු. 130,161 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | මුදල් වර්ෂයට අදාල ගෙවීම් කර නොතිබුණු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුය. මුදල් වර්ෂය පදනම්ව වියදම් ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.599,730 විශ්‍රාම වැටුප් පාරිතෝෂික වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන දිනට හඳුනාගත් සියළුම වගකීම්වල ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී ගිණුම්වලට ඇතුළත් කර නිවැරදිව දැක්වීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv). | පූර්ව වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.50,000 ක් වටිනා විදුලි ජනන යන්ත්‍රය ගිණුම් ගත කර නොතිබුණි | ස්ථාවර වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. පූර්ව වර්ෂවල යන්ත්‍රෝපකරණ ගිණුම්ගත කිරීමේදී සියළු වටිනාකම්වල එකතුවක් එකට ගෙන අදාල වර්ෂවල ගිණුම්ගත කර තිබුණි. |
| (v) | ප්‍රාදේශීය සභාව සතුව තිබෙන LG 2044 දරන ජල බවුසර් ට්‍රැක් රථයේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණු අතර එකක් රු.374,500 වු ඔරු 17 ක වටිනාකමද ගිණුම් ගත කර නොතිබුණි. | ශේෂ පත්‍ර දිනට සියළුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. ජල බවුසර් හා ඔරු වටිනාකම ගිණුම්ගත කර නොමැති නම් 2019 වර්ෂයේ ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |
| (vi). | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.150,000 ක විනෝද බදු ආදායම විවිධ තැන්පත් ලෙස දක්වා තිබුණි. | මුදල් වර්ෂයට අදාල ආදායම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (vii). | සමාලෝචිත වර්ෂයේ කඩකාමර 04 කින් ලැබිය යුතුව තිබුණු රු.163,200 ක කඩ කුලි ආදායම ගිණුම් ගත කර නොතිබුණි. | මුදල් වර්ෂයට අදාල ආදායම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (viii). | සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මුදල් වර්ෂයට අදාල ආදායම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුවේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල වසර 05 ක් ඉක්මවු කාලයක සිට පැවතඑමින් තිබුණු දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතු රු.84,022 මුද්දර බදු, ජාතිය ගොඩනැගීම් බදු හා එකතු කල අගය මත වු බදු ප්‍රේෂණය කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී මුළු වටිනාකම යැවීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල වසර 02 ක් ඉක්මවූ කාලයක සිට පැවත එමින් තිබුණු රු.1,806,537 ක් වූ ණයහිමි වටිනාකම නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | මුදල් ලැබුණු පසු මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 ක් ඉක්මවූ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබුණු රු.1,448,564 ක කර්මාන්ත ණයගැති වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනිමට කටයුතු කළයුතු වේ | කර්මාන්ත සඳහා සභාවට වෙත ලැබීමට නියමිත මෙම වටිනාකම් මේ දක්වා ලැබී නැත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.110,366,340 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාලව හිමිකම් සහතික, සමීක්ෂණ මණ්ඩල වාර්තා, ශේෂ සනාථ කිරීමේ ලිපි සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | 2019 වර්ෂයේදී ලේඛන සකස් කර ඉදිරිපත් කරමි. |

1.4 අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | සමාලෝචිත වර්ෂයේ රු.1,753,587 ක වැටුප් සහා දීමනා ගෙවීම් කර තිබුණු සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන් අරමුදලේ ලියා පදිංචි කර දායක මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. 1958 අංක 15 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ මෙම සේවක 06 දෙනා ලියාපදිංචි කර ඇත.2019 ජුනි මස සිට අදාල දායක ප්‍රේෂණය කිරිමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | සමාලෝචිත වර්ෂයේ රු.1,753,587 ක වැටුප් සහා දීමනා ගෙවීම් කර තිබුණු සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන් අරමුදලේ ලියා පදිංචි කර දායක මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | සේවා භාරකාර අරමුදල් පනත යටතේ මෙම සේවකයන් ලියාපදිංචි කර නොමැත.ඉදිරියේදී ලියාපදිංචි කර දායක මුදල් ප්‍රේෂණය කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------ | | | |
| | i. මු.රෙ. 389 | අතට භාර දෙනු ලබන චෙක්පත් සම්බන්ධ මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. චෙක්පත් භාරදීමේ ලේඛනය සභාව සතුව පැවතියද එය 2018 වර්ෂයට අදාලව යාවත්කාලීනව කර නොමැත. |
| | ii මු.රෙ. 880 | රජයේ නිලධාරීන්ගේ ඇප අඥා පනතට අනුකූලව ඇප ලබා ගැනීම සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී අදාල නිලධාරීන් සියළු දෙනාගෙන් ඇප තැන්පත් මුදල් ලබා ගැනිමට කටයුතු කරමි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 12 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරික්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී සභාවේ අරමුදල් යොදවා ඉන්ධන පරික්ෂාව කිරිමට කටයුතු කරමි. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පැමිණීම හා පිටවීම සනාථ කිරිම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරිමට එකඟවෙමි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ | චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය තොරතුරු රැස් කරගෙන ඇති අතර ලේඛණයක ඇතුළත් කිරීමට ඉදිරියේදී පියවර ගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | සභාව සතු අබලන් මෝටර් සයිකල් 2 ක් හා අත් ට්‍රැක්ටර් 2 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ | 2019 මැයි 13 දින එම වාහන තක්සේරු කර වටිනාකම් තහවුරු කර දෙන ලෙස යාන්ත්‍රික ඉංජිනේරු දැනුවත් කර ඇත. |

02. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,208,442 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.229,185 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1050,000 | 1,091,230 | 1,091,230 | - | 550,000 | 416,200 | 346,200 | 35,790 |
| කුලී | 3,461,800 | 3,042,219 | 3,042,219 | - | 2,964,600 | 2,558,085 | 2,570,685 | (48,943) |
| බලපත්‍ර ගාස්තු | 181,000 | 246,629 | 246,629 | - | 611,000 | 734,494 | 621,400 | - |
| වෙනත් ආදායම් | 1,108,500 | 1,319,227 | 988,782 | 976,572 | 1,920,000 | 888,098 | 2,167,016 | 816,017 |
| එකතුව | 5,801,300 | 5,699,305 | 5,368,860 | 976,572 | 6,045,600 | 4,596,877 | 5,705,301 | 802,865 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.864,072 ක් හා මුද්දර ගාස්තු රු.112,500 ක් විය. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතුවේ. | ලේඛන පරික්ෂා කර එම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා, පොදු මංමාවත් පිළිබඳ කාරණ විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අනුව අතුරු ව්‍යවස්ථා පැනවීම කළයුතු වේ. | පිළිතුරු සපයා නාමැත |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැළැස්මක් පිළියෙළ කල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

(ඇ). තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව දැනුවත් වී නොතිබුණි | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රවලට අනුව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ මේ වන විට අධ්‍යනය කරමින් පවතී. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 13 ක් සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි. | මාර්ග ධාවනයට අවශ්‍ය වන ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික ලබාගත යුතු වේ. | සභාවට වාහන පවරා ගැනීමේදී වියදම් දැරීමට ප්‍රමාණවත් මුදල් නොමැති නිසා කටයුතු කර ගැනිමට නොහැකි විය. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ තනතුරු 11 ක් සඳහා නිලධාරීන් 22 දෙනෙකු පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගෙන සභාවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කර ගත යුතු වේ. | මේ සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව හා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වාර්තා මගින් දැනුවත් කර ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/8 දරන 2009 අප්‍රේල් 17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව දුරකථන / විදුලි සංදේශ කුළුණු 09 කින් අයවිය යුතු රු.216,000 ක මුදල අයකර ගෙන නොතිබුණි. | සියළුම සම්ප්‍රේෂණ දුරකථන කුළුණු වලින් නියමිත පරිදි ගාස්තු අයකර ගත යුතු වේ. | පිළිගනිමි. විධිමත් පරීක්ෂාවක් සිදුකර ඉදිරි කටයුතු කරමි. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළිසරු අංගනය, රංග ශාලාව, පෙර පාසල හා කාර්යාලයේ ඇති විදුලි | වත්කම් නිවැරදිව ලේඛනගත කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කර ගැනිමට |

| | | |
|---|---|---|
| උපකරණ හා ලී බඩු අයිතම 178 හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. | | කටයුතු කරමි. |

3.5.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පරිහරණය කරනු ලබන අක්කර 151 රූඩ් 3 පර්චස් 15 ක ඉඩම් 60ක අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | සභාව පරිහරණය කරන සියළුම ඉඩම් සභාවේ නමට පවරා ගත යුතු වේ. | ප්‍රාදේශීය ලේකම්, පළාත් පාලන කොමසාරිස්,දිස්ත්‍රික් ඉඩම් නිලධාරී දැනුවත් කර ඇත. මෙම ඉඩම් මැනීමට තරම් ප්‍රමාණවත් මුදලක් සභාව සතුව නොමැත. |
| (ආ) | උතුරු මැද පළාත් සභා හා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභාවට ලබාදී තිබුණු රු.40,674,684 වටිනා වාහන 07 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිහරණය කරන සියළුම වාහන සභාවේ නමට පවරා ගත යුතු වේ. | අදාල වාහන සභාව වෙත පවරා ගැනිමට කටයුතු කිරිමට ප්‍රමාණවත් මුදල් සභාව සතුව නොමැත. මුදල් ලද වහාම වාහන පවරා ගැනිමට පියවර ගනිමි. |

3.5.3 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ රු.4,599,315 ක් වැය කර ඉදි කරන ලද කඩකාමර 02 ක් බදුදීම් සිදුකර නොතිබිම නිසා නිෂ්ක්‍රියව පැවතුනි. | කඩ කාමර බදුදීමට කටයුතු කළයුතු වේ. | රු.25,000 ක්වූ තක්සේරු මුදලට බදුකරු ඉදිරිපත් වී නොමැත. තක්සේරු මුදල් සංශෝධනය කර බදුකරුවෙකු තෝරා ගැනිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2007 වර්ෂයේදි ප්‍රාදේශීය සභාවට ලබාදි තිබුණු වටිනාකම රු.814,000 ක්වූ සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන උපකරණ සමාලෝචිත වර්ෂය දක්වාද භාවිතායට ගෙන නොතිබුණි. | වාර්ෂිකව බදුදීමට හෝ ආපසු භාරදිමට කටයුතු කළ යුතුවේ. | සහල් පිටි කට්ටලය බදු ගැනිමට ඉල්ලුම්කරුවන් ඉදිරිපත් වී නොමැත .එම කට්ටලය නැවත භාරගන්නා ලෙස උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය දැනුවත් කළ ද ඒ සඳහා ප්‍රතිචාරයක් නොමැත. |
| (ඇ) | 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය සඳහා අදියර 5 කින් රු. 11,063,978 වැය කරමින් ඉදිකරන ලද ජල ව්‍යාපෘතිය ප්‍රයෝජනයට නොගෙන | ජල ව්‍යාපෘතියේ වැඩ නිම කර කඩිනමින් ප්‍රයෝජනයට ගැනිමට කටයුතු | බල ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාදිමට තරම් ප්‍රමාණවත් ජල මුලාශ්‍රයක් නොමැතිකම නිසා 2018 වර්ෂයේ ජල සම්පාදන මණ්ඩලය මගින් නළ ළිඳක් ඉදිකරන ලදී. 2019 |

| | | |
|---|---|---|
| නිශ්කාර්යව පැවතුණි. | කළයුතු වේ. | වර්ෂයේ දී එම ඉතිරි වැඩ නිම කිරිමට ප්‍රතිපාදන වෙන් කිරිමට කටයුතු කර ඇත. අනතුරුව මෙම ව්‍යාපෘතිය මගින් ජනතාවට පානීය ජලය ලබාදිමට කටයුතු කරමි. |
| (ඇ). වටිනාකම රු.3,977,366 ක්වු ට්‍රැක්ටර් රථයක් හා කැබ්රථය වසරක් ඉක්මවු කාලයක සිට භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි | පරිහරණය නොකරන වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරිමට කටයුතු කළයුතු වේ. | RD -9451 ට්‍රැක්ටර් රථය ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කරන අතර කැබ්රථය අළුත්වැඩියා කිරිමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරමි. |

3.6 ප්‍රසම්පාදනය
---------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී සකස් කිරිමට කටයුතු කරමි. |